# Federation of University Teachers' Associations

FEDERATION OF UNIVERSITY TEACHERS' ASSOCIATIONS

Reg. No.: 8151

Department of Applied Music & Mass Communication,
University of the Visual & Performing Arts ,Sri Lanka
Tel.: +94 777 144642
Email: secretaryfuta@gmail.com



**President:**
Prof. Ruchika Fernando.
University of Peradeniya.
ruchika@vet.pdn.ac.lk
Tel: +94 0711373743

**Secretary:**
Mr.Charudaththe B. Illangasinghe.
University of Visual & Performing Arts
charu.i@vpa.ac.lk
Tel: +94 777 144642

**Treasurer:**
Dr.Mahesh Hordagoda.
University of Moratuwa.

**Vice Presidents:**
Prof.Aruna Wanninayake.
University of Kelaniya.

Prof.T.Sathaananthan.
Eastern University.

Prof.Vishaka Suriyabandara.
Uniuversity of Sri Jayewardenepura.

Mr. M.A.M Sameem.
South Eastern University.

Dr.Sachithra Silva.
University of Colombo.

**Assistant Secretaries:**
Dr.Heshan Kodithuwakku.
Wayamba University of Sri Lanka.

Dr.Chandima Gajaweera.
University of Ruhuna.

Dr.Udara Bulathsinhala.
Institute of Technology,
University of Moratuwa.

**Ex-officio:**
Prof.P.R Weerathunga.
Rajarata University of Sri Lanka.

***Non Ex-Co Members***

**Media Coordinator:**
Dr. Anuruddha Karunarathne.
University of Peradeniya.

**Web & IT Coordinator:**
Mr. U. K. Chaminda Pushpakumara.
University of Visual & Performing Arts.


08-09-2026

මාධ්‍ය නිවේදනය

**විශ්වවිද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයේ ඊළඟ පියවර ලෙස 2026 සැප්තැම්බර් 09 දින දිවයින පුරා රාජ්‍ය විශ්වවිද්‍යාල වල එක්දින සංකේත වැඩවර්ජනයක්**

විශ්වවිද්‍යාල පද්ධතියට සහ විශ්වවිද්‍යාල ආචාර්ය ප්‍රජාවට බලපා ඇති බරපතළ හා දිගුකාලීන ගැටලු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනය විසින් ගෙන යනු ලබන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයේ ඊළඟ පියවර ලෙස **2026 සැප්තැම්බර් 09 වන දින** දිවයින පුරා එක්දින සංකේත වැඩවර්ජනයක් පැවැත්වීමට තීරණය කර ඇත.

විශ්වවිද්‍යාල පද්ධතිය මුහුණ දී ඇති තීරණාත්මක ගැටලු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනය විසින් දීර්ඝ කාලයක් පුරා ගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමිය හා අධ්‍යාපන අමාත්‍යතුමිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අදාළ පාර්ශ්ව සමඟ අඛණ්ඩ සාකච්ඡා පවත්වා ඇත.

එම සාකච්ඡාවලදී විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින ගැටලු පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇති අතර, ඒවා විසඳීම සඳහා විවිධ යෝජනා සහ විසඳුම් ද ඉදිරිපත් කර ඇත. වත්මන් රජය විසින් ද මෙම ගැටලු පිළිබඳව අවස්ථා කිහිපයකදී පිළිගැනීම් සිදුකර ඇති අතර, ඒවාට විසඳුම් ලබාදීම සඳහා විවිධ පොරොන්දු සහ යෝජනා ඉදිරිපත් කර තිබේ.

කෙසේ වෙතත්, දීර්ඝ කාලයක් පුරා පැවති මෙම සාකච්ඡා සහ එකඟතා තිබියදීත්, විශ්වවිද්‍යාල පද්ධතිය මුහුණ දී ඇති මූලික ගැටලු විසඳීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත්, ප්‍රායෝගික සහ තිරසාර විසඳුම් මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

මෙම තත්ත්වය හේතුවෙන් ඉගැන්වීම, පර්යේෂණ, ශිෂ්‍ය අධීක්ෂණය සහ අනෙකුත් අධ්‍යයන වගකීම් අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගෙන යාමේ හැකියාව බරපතළ ලෙස සීමා වෙමින් පවතී. එමෙන්ම, ප්‍රමාණවත් පහසුකම් හා සම්පත් නොමැතිව වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබාදීමට සිදුවීම මෙම අර්බුදය තවදුරටත් උග්‍ර කර තිබේ.

මෙම අර්බුදකාරී තත්ත්වය පිළිබඳව රජයට නැවතත් අවධානය යොමු කරමින්, අප විසින් 2026 සැප්තැම්බර් 02 වන දින දිවයින පුරා රාජ්‍ය විශ්වවිද්‍යාල ඉදිරිපිට දිවා විවේක කාලය තුළ විරෝධතා ව්‍යාපාරයක් ද පැවැත්වූ අතර නිසි විසඳුම් කඩිනමින් ලබා දෙන ලෙස ඉල්ලා 2026 සැප්තැම්බර් 09 වන දින එක්දින සංකේත වැඩවර්ජනයක් පැවැත්වීමට තීරණය කර ඇත.

# Federation of University Teachers' Associations

FEDERATION OF UNIVERSITY TEACHERS' ASSOCIATIONS

**Reg. No.: 8151**

Department of Applied Music & Mass Communication,
University of the Visual & Performing Arts ,Sri Lanka
Tel.: +94 777 144642
Email: secretaryfuta@gmail.com


මෙම ක්‍රියාමාර්ගය මගින් රජයට අවධාරණය කරනු ලබන්නේ, රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය මුහුණ දී ඇති අර්බුදය තවදුරටත් කල් දැමිය නොහැකි බවත්, තාවකාලික හෝ කෙටි කාලීන විසඳුම් වෙනුවට කඩිනම්, පුළුල් සහ තිරසාර විසඳුම් ක්‍රියාත්මක කළ යුතු බවත්ය.

රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය ආරක්ෂා කිරීම, උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම, සිසුන්ගේ අධ්‍යාපන අයිතිය ආරක්ෂා කිරීම සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට සාධාරණ හා තිරසාර සේවා තත්ත්වයන් සහතික කිරීම මෙම ක්‍රියාමාර්ග වල මූලික අරමුණයි.

එබැවින්, විශ්වවිද්‍යාල පද්ධතියේත්, විශ්වවිද්‍යාල ආචාර්ය ප්‍රජාවේත්, සිසුන්ගේ සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේත් අනාගත යහපත උදෙසා මෙම ගැටලු සඳහා කඩිනමින් මැදිහත් වී ප්‍රායෝගික හා තිරසාර විසඳුම් ලබාදෙන ලෙස විශ්වවිද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනය රජයෙන් ඉල්ලා සිටී.

ලේකම්

විශ්වවිද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනය


**President:**
Prof. Ruchika Fernando.
University of Peradeniya.
ruchika@vet.pdn.ac.lk
Tel: +94 0711373743

**Secretary:**
Mr.Charudaththe B. Illangasinghe.
University of Visual & Performing Arts
charu.i@vpa.ac.lk
Tel: +94 777 144642

**Treasurer:**
Dr.Mahesh Hordagoda.
University of Moratuwa.

**Vice Presidents:**
Prof.Aruna Wanninayake.
University of Kelaniya.

Prof.T.Sathaananthan.
Eastern University.

Prof.Vishaka Suriyabandara.
Uniuversity of Sri Jayewardenepura.

Mr. M.A.M Sameem.
South Eastern University.

Dr.Sachithra Silva.
University of Colombo.

**Assistant Secretaries:**
Dr.Heshan Kodithuwakku.
Wayamba University of Sri Lanka.

Dr.Chandima Gajaweera.
University of Ruhuna.

Dr.Udara Bulathsinhala.
Institute of Technology,
University of Moratuwa.

**Ex-officio:**
Prof.P.R Weerathunga.
Rajarata University of Sri Lanka.

***Non Ex-Co Members***

**Media Coordinator:**
Dr. Anuruddha Karunarathne.
University of Peradeniya.

**Web & IT Coordinator:**
Mr. U. K. Chaminda Pushpakumara.
University of Visual & Performing Arts.